
# කුරුළු කූඩුව



කතාව හා චිත්‍ර : ශෙනුකි අමාෂා කුමාරසිංහ

# කුරුළු කූඩුව

කතාව හා චිත්‍ර : **ශෙනුකි අමාෂා කුමාරසිංහ**

කෘතියේ නම : කුරුළු කූඩුව

ප්‍රථම මුද්‍රණය : 2025-02-08

කතාව හා චිත්‍ර : ශෙනුකි අමාෂා කුමාසිංහ

ලිපිනය : අංක:52/1, ධර්මරාජ මාවත, මහනුවර.

මුද්‍රණය : චම්පා ස්ටෝර්ස්, දළදා වීදිය, මහනුවර.

ISBN අංකය : 978624208253-0

# පිදුම

**මාගේ ආදරණීය**
**මහාමායා මෑණියන්ට**
**මේ පොත**
**ආදරයෙන් පුදමි.**

# ස්තූතිය

මෙම පොත නිර්මාණය කිරීමට හා
අඩුපාඩු කියා දුන්
මාගේ මවට හා පියාට පළමුව
ස්තූති කරමි.

විෂයාන්තර කටයුතු වලදී මෙන්ම
විෂය බාහිර  කටයුතු වලදීත්
මුල් තැන ලබා දෙමින්
අර්ථවත් කිරීමට කැපවෙන
අප පාසල වන
මහ/මහාමායා  බාලිකා විදුහල
හා
ගුරු මඩුල්ලට
මාගේ ගෞරවණීය ස්තූතිය
මින් පුද කරමි.

කතා  :  ශෙනුකි  අමාෂා කුමාරසිංහ
ලිපිනය  :  52/1, ධර්මරාජ  මාවත, මහනුවර.
දුරකතන අංකය :  077-8919114

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

අපේ ගෙදර වත්ත පහළ ජම්බු ගහක කුරුළු කූඩුවක් තිබුණා.



එක දවසක් අම්මයි වත්ත
පහළට ගියා



එක පාරටම මම කිච් බිච් ගාලා කුරුල්ලො කෑ ගහන සද්දයක් ඇසුණා.



මම වට පිට බලන කොට ජම්බු ගහ
අස්සෙන් ඒ සද්දය ඇහුණේ
මම දුවගෙන ගියා ගහ අස්සට




අනේ ජම්බු ගහ උඩ තිබුණු කුරුළු කූඩුව බිමට වැටිලා පැටවු ටික කෑ ගහනවා එයාලට ඉගිලෙන්නත් බැහැ



මම ඉක්මනට කූඩුව ළඟට ගිහින් පැටව් ටික කූඩුවට දාලා කූඩුව අතට ගත්තා



මොකද දන්නවාද අපේ ගෙදර
ඉන්න  පූස් පැටියා කුරුළු
පැටව් ටික දකින්න ඉස්සර වෙලා



කුරැළු කූඩුව ජම්බු ගහ උඩින්
තියන්න ඕනේ මම අම්මට කිවුවා



අම්මා ඉක්මනට මට ඉනිමඟ
ගෙනත් ජම්බු ගහට තියලා දුන්නා



මම ඉනිමග දිගේ කුරුළු
කූඩුව අරගෙන ගිහින්
ජම්බු ගහේ දෙබලක කූඩුව
තිබ්බා



මට හරිම සතුටුයි කුරුළු පැටව්
ටික බේරගන්න ලැබුණු නිසා.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වගයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්